## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 6 ශ්‍රේණිය - දෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **6 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 01. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිළි කරයි. | 1.4 මිනිස් හැසිරීම් අනුකරණය කරයි. | ▪ මානව චර්යාවන් අනුකරණය කරයි. | ▪ මිනිස් හැසිරීම් තුළ දකින බාහිර චලන ,ඉරියව් හා හැඩතල අනුකරණය කිරීම. | 1.4 මිනිසුන් අනුකරණය කරමු. | 02 |
| | 1.5 සත්ත්ව චර්යාවන් අනුකරණය කරයි. | ▪ සත්ව ලෝකයේ විවිධ චර්යාවන් නිරීක්ෂණය කරමින් ලබන වින්දනය ප්‍රකාශ කරයි.<br>▪ සත්ව චර්යාවන් අනුකරණය කරයි. | ▪ චලන, ඉරියව් හා හැඩතල ඇසුරින් සත්ව චර්යාවන් අනුකරණය කරයි. | 1.5 සතුන් අනුකරණය කරමු. | 02 |
| | 1.6 "අභිනය" හඳුනා ගනියි. | ▪ නාට්‍ය යනු කුමක්දැයි හඳුනාගනිමින් විස්තර කරයි.<br>▪ කතන්දර හා නාට්‍ය අතර වෙනස හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍ය නැරඹීමෙන් වින්දනයක් ලබයි.<br>▪ නාට්‍යයක් නරඹා ලබාගත් වින්දනාත්මක අත්දැකීම් විස්තර කරයි. | ▪ නාට්‍ය පිළිබඳව අධ්‍යයනය කිරීම. | 1.6 නාට්‍ය හඳුනාගනිමු. | 02 |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිකල්පනය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණ කරණයෙ හි යෙදෙයි. | 2.5 මානුෂ හා අධිමානුෂ චරිත උපයෝගී කරගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි. | ▪ සාමාජික, සංස්කෘතික, ආධ්‍යාපනික හා ජාතික මට්ටම් අනුව විවිධ මානුෂ හා උපකල්පිත අධිමානුෂ චර්යාවන්හි විශේෂතා පවතින බව හඳුනාගනිමින් ප්‍රකාශ කරයි.<br>▪ විවිධ චරිත ඇතුළත් නාට්‍ය, රූපවාහිනී නිර්මාණ, පින්තූර, වීඩියෝපට,කතන්දර පොත් ආදිය නැරඹීමට කැමැත්ත පල කරයි.<br>▪ විවිධ චරිත ඇසුරු කොටගෙන ක්ෂණික නිරූපණ ඉදිරිපත් කරයි. | ▪ මානුෂ හා අධිමානුෂ චරිත උපයෝගී කරගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි. | 2.5 විවිධ චරිත හඳුනාගනිමු.<br>ඒවා සතුටින් රඟමු. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ▪ ''නාට්‍යෝපකරණ''යනු කුමක්දැයි අර්ථ දක්වයි.<br>▪ රූපණය සඳහා නාට්‍යෝපකරණ භාවිතයේ ඇති අවශ්‍යතාව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍යෝපකරණ භාවිත කරමින් කේවල ව හෝ සාමූහික ව ක්ෂණික නිරූපණයන්හි නියැළෙයි. | ▪ විවිධ භාණ්ඩ පාදක කොටගෙන ක්ෂණික නිරූපණයෙහි යෙදෙයි. | 2.6 සතුටු සිතින් අපි රඟමු. | 01 |
| | 2.7 දෛනික සිදුවීම් ආශ්‍රිත ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. | ▪ දෛනික සිදුවීම්හි නාට්‍යමය ගුණය අඩංගු අවස්ථා පෙළගස්වයි.<br>▪ දෛනික සිදුවීම් ආශ්‍රිත අත්දැකීම් නාට්‍යමය නිර්මාණ සඳහා යොදාගත හැකි බව පිළිගනිමින් අදහස් දකවයි.<br>▪ දෛනික සිදුවීම් ආශ්‍රිත ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. | ▪ දෛනික සිදුවීම් ආශ්‍රිත ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. | 2.7 ජීවන අත්දැකීම් ඇසුරින් ක්ෂණික නිරූපණ සිදු කරයි. | 01 |
| | 2.8 පරිකල්පනය පිබිදෙන ආකාරයේ විවිධ නිර්මාණ කාර්යයන්හි නිරත වෙයි. | ▪ පරිකල්පනය යනු කුමක්දැයි අර.ථ දක්වයි.<br>▪ සාර්ථක නිර්මාණ බිහිකිරීමෙහි ලා පරිකල්පනය අවශ්‍ය වන බව පිළිගෙන අදහස් දක්වයි.<br>▪ පරිකල්පනය මෙහෙයවා විවිධ නිර්මාණ කාර්යයන්හි නිරත වෙයි. | ▪ පරිකල්පනය පිබිදෙන ආකාරයේ විවිධ නිර්මාණ කාර්යයන්හි නිරත වෙයි. | 2.8 මනසින් නව ලොව දකිමු<br>නව නිමැවුම් බිහි කරමු | 01 |
| | 2.10 ජනකතා පරිශීලනයෙන් පරිකල්පනය මෙහෙයවා නව නිර්මාණකරණයෙහි යෙදෙයි. | ▪ දේශීය මෙන් ම විදේශීය ජනකතා කිහිපයක් නම් කරයි. | ▪ ජනකතා පරිශීලනයෙන් පරිකල්පනය මෙහෙයවා නව නිර්මාණ-කරණයෙහි යෙදීම. | 2.10 පැරණි ජනකතා, නව අර්ථකථන සහිත ව ප්‍රතිනිර්මාණය කිරීම. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. | | ▪ ජනකතාවල මතුපිට අදහසක් මෙන්ම යටිපෙළ අර්ථයක්ද ඇතිබව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>▪ ජනකතා නව අර්ථයක් සහිත ව ප්‍රති නිර්මාණය කරයි. | | | |
| | 3.3 චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් ක්‍රියාකාරකම්වල යෙදේ. | ▪ විවිධ චරිතවලට ආවේණික වාග් විලාසයක් පවතින බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ විවිධ හඬවල් අනුකරණය කරමින් චරිත නිර්මාණය කිරීමට කැමැත්ත පල කරයි.<br>▪ ඒ ඒ චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් අදාළ ක්‍රියාකාරකම්හි යෙදෙයි. | ▪ සංවාද භාවිතය හා හුඬ අනුකරණය කිරීම. | 3.3 නියම හඬින් දෙබස් කියමු දෙබස් කියා රැඟුම් රඟමු. | 01 |
| | 3.4 හඬෙහි විවිධ පරාස මතුවන සේ සංවාද භාවිත කරයි. | ▪ වචන හසුරුවන විට හඬෙහි විවිධ ස්වරූපයන් විවිධ රිද්ම, තාල ද තිබෙන බව විස්තර කරයි.<br>▪ හඬ පාළනය සඳහා කටහඬ පුහුණුව හා ශ්වසන අභ්‍යාස අවශ්‍ය බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ විවිධ සත්ව හා මිනිස් හඬ අනුකරණය කරයි. | ▪ සංවාද භාවිතයේදී විවිධ පරාසවලට අනුකුල ව කටහඬ යොදා ගැනීම. | 3.4 හැඟීම් ප්‍රකාශයට කටහඬ යොදා ගනිමු | 01 |
| | 3.5 විවිධ හැඟීම් හා අවස්ථාවලට උචිත පරිදි සංවාද හා ශබ්ද භාවිත කරයි. | ▪ විවිධ ශබ්ද උත්පාදනය සඳහා යොදා ගත හැකි භාණ්ඩ හා ද්‍රව්‍ය නම් කරයි.<br>▪ නාට්‍යයක අවස්ථා තීව්‍ර කිරීම සඳහා විවිධ ශබ්ද දායක කර ගත හැකි බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ අර්ථාන්විත ව සංවාද හා ශබ්ද භාවිත කිරීම තුළින් හැඟීම් හා අවස්ථා ප්‍රකාශ කළ හැකි බව පිළිගනිමින් ප්‍රකාශ කරයි. | ▪ විවිධ හැඟීම් හා අවස්ථාවන්ට උචිත පරිදි අර්ථාන්විත ව සංවාද හා ශබ්ද භාවිත කිරීම. | 3.5 හඬ යොදමු. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ▪ විවිධ ශබ්ද හා සංවාද යොදා ගනිමින් නාට්‍යමය අවස්ථාවක් ඉදිරිපත් කරයි. | | | |
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.3 ජන කතා, උපමා කතා ආදියෙහි එන සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි. | ▪ ජනකතා ආශ්‍රිත නිර්මාණ ඇසුරින් වින්දනයක් ලබයි.<br>▪ ජනකතා ආශ්‍රිත කවි, ගී හා සිතුවම් නිර්මාණය කරයි.<br>▪ ජනකතා ඇසුරින් නාට්‍ය නිර්මාණය කරයි. | ▪ ජනකතා, උපමා කතා ආදියෙහි එන සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි. | 4.3 ජනකතා ආශ්‍රිත විවිධ නිර්මාණ කරමු. | 02 |
| | 4.4 සංස්කෘතික හා සාමාජික වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | ▪ චාරිත්‍ර හා වාරිත්‍ර (සිරිත්, විරිත් ) වෙන් වෙන් ව හඳුන්වයි.<br>▪ යහ පුරුදු ඇති කර ගැනීම සඳහා සිරිත් මල්දම ග්‍රන්ථය උපකාරී වන බව පිළිගෙන අදහස් දක්වයි.<br>▪ 'සිරිත් මල්දම'' ග්‍රන්ථයෙන් තෝරා ගත් කාව්‍ය තේමා කර ගනිමින් නාට්‍යයක් නිර්මාණය කර ඉදිරිපත් කිරීම. | ▪ සිරිත් මල්දම ඇසුරෙන් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම. | 4.4 හොඳ සිරිත් පිළිපදිමු. | 02 |